ının
# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

**අංක 2443/34 - 2025 ජූලි මස 01 වැනි අඟහරුවාදා - 2025.07.01**

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)

# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : MUN/LND/PMTAQ/05/04/02.
*ඉඩම් අමාත්‍යාංශයේ යොමු අංකය* : 4-3/8/2011/PC/185.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ විස්තර* :-

වයඹ පළාතේ, පුත්තලම දිස්ත්‍රික්කයේ, මුන්දලම ප්‍රාදේශීය මහලේකම් කොට්ඨාසයේ, අංක 601/බී නල්ලන්දලුව ග්‍රාම නිලධාරි කොට්ඨාසයේ නල්ලන්දලුව ගමේ පිහිටි ක.සි. 410236 දරන මූලික පිඹුරෙහි පහත සඳහන් බිම් කැබැල්ල :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: නල්ලන්දලුව ජුම්මා පල්ලිය ඉඩම; හිමිකම් කියන අය : සභාපති, නල්ලන්දලුව ජුම්මා පල්ලිය, නල්ලන්දලුව, මදුරන්කුලිය; ඉඩමේ ප්‍රමාණය: හෙක්ටයාර් 0.1528.

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 ඔක්තෝබර් මස 08 වැනි දින පෙ.ව. 10.00 ට මුන්දලම ප්‍රාදේශීය මහ ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 ඔක්තෝබර් මස 01 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

එම්. ඒ. අයි. එච්. පෙරේරා,
ප්‍රාදේශීය ලේකම්,
මුන්දලම.

2025 ජූනි මස 24 වැනි දින,
මුන්දලම ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0010

---

**ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)**

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*යොමු අංකය* : 4/3/4/2013/D/494.
*ප්‍රාදේශීය ලේකම්ගේ යොමු අංකය* : ප්‍රාලේ/අක්/5/9/01.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම/ පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැව්, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

1A - G 044717 – 09 (2025/07)

*මෙම අති විශෙෂ ගැසට් පත්‍රය* www.documents.gov.lk *වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

*ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර* :-

දකුණු පළාතේ, ගාල්ල දිස්ත්‍රික්කයේ, අක්මීමන ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, අංක 112ඒ වලහන්දූව ග්‍රාම නිලධාරි වසමේ වලහන්දූව ගමේ පිහිටි ගාල්ල දිස්ත්‍රික් මිනින්දෝරු අධිකාරි විසින් පිළියෙල කරන ලද අංක කැ.සි.අ. 810239 කලාප අංක 04 පත්‍ර අංක 1 හා 2024.12.31 දිනැති පිඹුරේ පෙන්නුම් කර ඇති ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.6070 ක් වූ පහත විස්තර කරන ඉඩම් කැබැලි 02 :

01. **කැබලි අංක 01**
ඉඩමේ නම: වලහන්දූවවත්ත; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.0203.

*උතුරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83106 සහ 83108); *නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83108); *දකුණට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83108 සහ 83106); *බටහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83108 සහ 83106) සහ මෙම පත්‍රයේ කැබලි අංක 2;

02. **කැබලි අංක 02**
ඉඩමේ නම: වලහන්දූවවත්ත; හිමිකම් කියන අය : රජය; ප්‍රමාණය: හෙක්ටයාර් 0.5867.

*උතුරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83107 සහ 83106) මෙම පත්‍රයේ කැබලි අංක 1 සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83108); *නැගෙනහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83106) මෙම පත්‍රයේ කැබලි අංක 1 සහ ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83108 සහ 83107); *දකුණට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83107); *බටහිරට* : ඉඩම් ප්‍රතිසංස්කරණ කොමිෂන් සභාව හිමිකම් කියන වලහන්දූවවත්ත (හි.පි. 83107 සහ 83106);

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගේ ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2025 සැප්තැම්බර් මස 24 වැනි දින පෙ.ව. 10.00 ට අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2025 සැප්තැම්බර් මස 17 වැනි දිනට මත්තෙන්, ඒ ඉඩම/පරවශතාවය සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම/පරවශතාවය ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

ටී. ජී. එස්. සජීවනී,
ප්‍රාදේශීය ලේකම්,
අක්මීමන.

2025 ජූනි මස 20 වැනි දින,
අක්මීමන ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

EOG 07 - 0011

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.